# කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk


නිවේදන අංකය : 03 WW/TC/21/12/03/03
වර්ණය : ඇම්බර්

## මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ පවතින අඩු පීඩන කලාපය පිළිබඳ අවවාදාත්මක නිවේදනය

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ, ස්වභාවික විපත් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය විසින් 2021 දෙසැම්බර් මස 03 වන දින පෙ.ව 10.00 ට නිකුත් කරන ලදී.

### මධ්‍යම බෙංගාල බොක්ක ගැඹුරු මුහුදු ප්‍රදේශ සඳහා

### සැලකිලිමත් වන්න!

ගිනිකොණ සහ මධ්‍යම-නැගෙනහිර බෙංගාලබොක්ක මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව පවතින අඩු පීඩන කලාපය පීඩන අවපාතයක් දක්වා වර්ධනය වී ඇති අතර එය උතුරු අක්ෂාංශ 13.0°N සහ නැගෙනහිර දේශාංශ 86.0°E මධ්‍යගතව පවතී. එය ඉදිරි පැය 24 තුළ වයඹ දෙසට ගමන් කර මධ්‍යම බෙංගාල බොක්ක ප්‍රදේශය හරහා සුළි කුණාටුවක් දක්වා තීව්‍ර වී, දෙසැම්බර් 4 වැනි දින උදෑසන පමණ උතුරු ආන්ද්‍රා ප්‍රදේශය - දකුණු ඔඩිෂා වෙරළට ඔබ්බෙන් බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක වෙත ළඟා වීමට ඉඩ ඇත. මෙම මුහුදු ප්‍රදේශ වල පැ.කි.මී. (50-60) ඉතා තද සුළං පවතින අතර සහ විටින් විට පැ.කි.මී. 70 පමණ දක්වා වැඩිවිය හැකි අතර මෙම මුහුදු ප්‍රදේශ ඉතා රළු වේ.

Advisory for the Low Pressure Area
Issued at 10.00 a.m. on 03 December 2021, valid for next 24 hours




### ධීවරයින් සඳහා අවවාදාත්මක නිවේදනය :

- ඉදිරි පැය 72 තුල ගිනිකොනදිග බෙංගාල බොක්ක, නිරිතදිග බෙංගාල බොක්ක උතුරු ප්‍රදේශය සහ බටහිර-මධ්‍යම බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයන්හි ධිවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.

- දැනට මෙම මුහුදු ප්‍රදේශ වල ධීවර කටයුතුවල යෙදී සිටින පිරිස වහාම ගොඩබිමට හෝ ආරක්ෂිත ස්ථානයක් වෙත පැමිණෙන ලෙසට දන්වා සිටිනු ලැබේ.